දුර්ලභ

ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිපත්තිය.

( තුලනාත්මක අධ්‍යයනයක් )

# Central Banking Policy In Sri Lanka.
(A Comparative Study)

එල්.ආර්.ඒ. චන්ද්‍රසිරි

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ

විද්‍යාලංකාර මණ්ඩපයේ

ශාස්ත්‍රපති උපාධිය ( ආර්ථික විද්‍යාව )

සඳහා පාර්ශ්වීය අවශ්‍යතාවයක් සම්පූර්ණ

කිරීමට ඉදිරිපත් කරන නිබන්ධයයි.

A thesis submitted to the
Vidyalankara Campus of the
University Of Sri Lanka, in
partial fulfilment for the
Degree Of Master Of Arts
(Economics).

1972.

21

## සාරාංශය.

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ පාර්ශ්විය අවශ්‍යතාවයක් සඳහා ඉදිරිපත් කරන මෙම නිබන්ධය පරිච්ඡේද 7 කින් යුක්තය. "මහ බැංකුව පිහිටුවීම හා එහි පරමාර්ථ" යන ශීර්ෂය යටතේ ඇති පළමුවෙනි පරිච්ඡේදයට මහ බැංකුව පිහිටුවීමට පෙර ශ්‍රී ලංකාවේ පැවති බැංකු හා මූල්‍ය කටයුතු පසුබිම් පිළිබඳ කෙටි විස්තරයක් ද, මහ බැංකුව පිහිටුවීමට මුල්වූ එක්ස්ටර් වාර්තාව හා මුදල් නීති පනත පිළිබඳ විග්‍රහයක් ද, මහ බැංකුවේ පරමාර්ථ පිළිබඳ හැඳින්වීමක් ද, ඇතුලත් වේ.

දෙවැනි පරිච්ඡේදය මිඩංගුව් තිබෙන්නේ "මහ බැංකු ක්‍රමයේ රටාව වෙනස් වීම" පැහැදිලි කිරීමටයි. විශේෂයෙන් සංවර්ධනය වන රට වල මහ බැංකු කුම රටාව සම්ප්‍රදායනුකූල මහ බැංකු මූල ධර්ම වලින් වෙනස් වී ඇති ආකාරය, සංවර්ධනය වන ආසියා හා ලතින් ඇමෙරිකානු රටවල් කීපයක මහ බැංකු ව්‍යවස්ථා හා අරමුණු සමඟ සසඳමින් පරීක්ෂාවට ලක්කෙරේ. මේ සැසඳීමෙන් උත්සාහ කරන්නේ සංවර්ධනය වන රටවල ආර්ථික තත්වයන් හා අවශ්‍ය තාවයන් අනුව මහ බැංකු ක්‍රමය සකස් කර ගැනීමේ වැදගත් කම හුවා දැක්වීමටයි.

මහ බැංකුවේ "බලතල, පාලන උපකරණ, හා මූල්‍ය ප්‍රතිපත්තිය" කොටස් දෙකකින් යුතුව තුන් වැනි පරිච්ඡේදයෙන් සැලකිල්ලට ලක් කොට ඇත. පළමු වැනි කොටසට මුදල් නීති පනතෙන් මහ බැංකුවට පවරා ඇති බලතල, විශේෂ වග කීම් හා ප්‍රධාන වශයෙන් එම බලතල ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පාන ගැටළු හා සීමාවන් ඇතුලත් කර ඇති අතර මුහුණ පෑ ආර්ථික උච්චාවචනයන් මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ ආකාරය සමඟ සලකා බැලීමයි දෙවැනි කොටසින් සිදු වී ඇත්තේ.

"මහ බැංකුව හා රජය (භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය) අතර ඇති සම්බන්ධය" පෙන්වා දීමට හතර වැනි පරිච්ඡේදය වෙන් වී ඇත. අන් රටවල මෙන්ම ලංකාවේ ද මෙම සම්බන්ධය පලුදුවී ඇති අවස්ථා ප්‍රයෝජනයට ගෙන සාර්ථක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට මහ බැංකු හා රජය අතර ඉතා කිට්ටු සහයෝගයක් තිබීමේ අවශ්‍යතාවය සනාථ කරන අතර 'මහ බැංකු ස්වාධීනත්වය ' යන්නද පැහැදිලි කර දීමට උත්සාහ කරයි.

පස්වැනි පරිච්ඡේදයෙන් "මහ බැංකුව මුහුණ පා ඇති ගැටළු හා සීමාවන්" දීර්ඝ වශයෙන් පරීක්ෂාවට භාජනය කෙරේ. ආර්ථික ව්‍යුහය නිසා පැන නගින ගැටළුද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නිසා මෙන්ම මහ බැංකු අරමුණු තුළම පවතින පරස්පරවිරෝධී ලක්ෂණ වලින් පැන නගින ගැටළුද, විමසිල්ලට හසුවී ඇත.

හයවෙනි පරිච්ඡේදයෙන් "මහ බැංකුවේ ප්‍රගතිය" පිළිබඳ විශ්ලේෂණයක් කර ඇත. තම අරමුණු ඉටුකර ගෙන ඇති ආකාරය, පාලන ක්‍රම ක්‍රියා ත්මකකිරීම තබා ඇති ඉදිරි පියවර, දිගු කාලීන ණය හා සංවර්ධන බැංකු ක්‍රමය ආදී උප මාර්තෘකා යටතේ විස්තර කරයි. මූලික වශයෙන් කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් පවතින ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ණය ප්‍රශ්නය ගැන විශේෂ අවධානයක් යොමු කර ඇති අතර මේ විෂයය යෙහි ඉන්දිය සංචිත බැංකුව අනුගමනය කර ඇති ප්‍රතිපත්ති සමග සසඳමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආකල්පය තුලනාත්මකව විග්‍රහයකට භාජනය කෙරේ.

අවසාන එනම් හත්වැනි පරිච්ඡේදයේ " නිගමයෙන්" කර ඇත්තේ මුහුණ පෑ ගැටළුවලට පිළියම් සෙවීමේදී මහ බැංකුව සතුව පැවති බැඳීම් (ව්‍යවස්ථාමය මෙන්ම අනෙක්) හා වගකීම් පැහැදිලි කිරීමත් ක්‍රමයෙන් මහ බැංකුව ආර්ථිකයේ අවශ්‍යතාවයන් වඩාත් නිවැරදිව හා සමීප ආකල්පයකින් හඳුනා ගැනීමට උත්සාහ කර ඇති බව පෙන්වා දීමත්ය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පවතින සියලුම ආර්ථික ගැටළු වලට විසඳුම ඇත්තේ "ආර්ථික වෘද්ධිය" යන වචන දෙකේ පමණක් බවද මහ බැංකුව තමන්ගේම "අලුත්" , "නිර්මාණාත්මක" ක්‍රම යොයා ගතයුතු බවද පෙන්වා දී ඇත.